# පොළොන්නරුව මහා නගර සභාව සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම - 2024

පොළොන්නරුව මහා නගර සභාවට 2024 වර්ෂය සඳහා අවශ්‍ය පහත සඳහන් ද්‍රව්‍ය හා සේවාවන් සැපයීම සඳහා සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කරනු ලැබේ.ඒ සඳහා කැමැත්තක් දක්වන දීප ව්‍යාප්ත පිළිගත් සැපයුම්කරුවන්ගෙන්, නිෂ්පාදකයන්ගෙන්, බෙදාහරින්නන්ගෙන්,කොන්ත්‍රාත්කරුවන්ගෙන් ,රාජ්‍ය ආයතන,රාජ්‍ය සංස්ථා ,සමුපකාර සංගම් හා බාහිර පුද්ගලයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලබයි.

ඉල්ලුම්පත්‍ර, 2024.12. 29 දින **පෙ.ව.10** ට ප්‍රථම, **නාගරික කොමසාරිස්, මහ නගර සභාව පොළොන්නරුව** යන ලිපිනයට ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් භාරදිය යුතුය.ලිපි කවරය ඉහල වම්පස කෙළවරේ **" 2024 වර්ෂය සඳහා සැපයුම් කරුවන් ලියාපදිංචි කිරීම"** යනුවෙන් සඳහන් කළ යුතුය.

## 01.මුදල් ගෙවීම

අයදුම්පත්‍ර ගාස්තුව රු.**500** ක් වන අතර ඉල්ලුම් කරනු ලබන එක් එක් අයිතම අංක සියල්ල එකම ඉල්ලුම් පත්‍රයේ සටහන් කළ යුතු අතර එක් අයිතමයකට රු.**500** කමුදලක් අය කරනු ලබයි.

අප කායර්ාලයේ සරප් අංශය වෙත මුදල් ගෙවා ලබා ගන්නා වූ කුවිතාන්සිය අයදුම් පතට ඇමිණිය යුතුය. කුවිතාන්සි අමුණා නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරණු ලැබේ.

## 02.කොන්දේසි

1. සැපයුම් කරුවන් ලියාපදිංචි කිරීම පොළොන්නරුව මහ නගර සභාවේ ප්‍රසම්පාදන තීරණ වලට යටත් වේ.
2. ලියාපදිංචි සැපයුම් නරුවන්ගේ ලේඛණය අනුව ඉදිරියේදී මිල ගණන් කැඳවනු ලබන අතර ආයතනයේ අවශ්‍යතාවය මත පොළොන්නරුව මහා නගර සභා ප්‍රසම්පාදන කමිටු තීරණයන්ට යටත්ව බාහිර ආයතන මගින්ද අවස්ථානුකූලව මිළ දී ගැනීම් සිදු විය හැකිය.
3. ලියාපදිංචි සැපයුම්කරුවන් මහ නගර සභාවේ දැනුම් දීම් අනුව මිළ ගණන් ලබා දීමට හා භාණ්ඩ හා සේවා ලබා දීමට බැදී සිටී.

## 03.සුදුසුකම්

**සැපයුම්කරුවන්/ කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම**

1. ශ්‍රී ලංකාවේ ස්ථිර පදිංචි කොන්ත්‍රාත්කරුවන්ට සහ ශ්‍රී ලංකාව තුල ස්වකීය ව්‍යාපාර හෝ ශාඛා ආයතන පවත්වාගෙන යන කොන්ත්‍රාත්කරුවන්ට කොන්ත්‍රාත් සඳහා ලියාපදිංචි විය හැකි අතර ,සෑම කොන්ත්‍රාත්කරුවෙක්ම **" ඉදිකිරීම් කමර්ාන්ත සංවධර්න අධිකාරිය (CIDA) "** ආයතනයේ ලියාපදිංචි වී සිටිය යුතුය.( අයදුම්පත්‍රය සමග ලියාපදිංචියේ පිටපතක් ඉදිරිපත් කළ යුතුය.)
2. සම්පූණර්යෙන්ම දැවයෙන් නිම කරණ ලද භාණ්ඩ සැපයීම සඳහා, වන සංරක්ෂණ දෙපාතර්මේන්තුව විසින් නිකුත් කළ අවසර පත්‍රය ලබා තිබිය යුතුය.(අයදුම්පත්‍රය සමග එහි පිටපතක් ඉදිරිපත් කළ යුතුය.)
3. සැපයුම් ද්‍රව්‍ය විකිණීම සහා සේවා සැපයීම සඳහා පවත්වාගෙන යන ආයතන ඒ සඳහා පළාත් පාලන ආයතනයේ ලියාපදිංචි වීමට අදාලව නෛතිකව ලබාගත යුතු බලපත්‍ර ලබාගෙන තිබිය යුතුය.සෑම ව්‍යාපාරික ආයතනයක්ම තම ව්‍යාපාරය පවත්වාගෙන යාම වෙනුවෙන් පළාත් පාලන ආයතනයකට බදු මුදල් (වෙළද බලපත්‍ර ගාස්තු )ගෙවා තිබිය යුතුය.(2023 වර්ෂයේ බදු මුදල් ගෙවූ රිසිට් පත්‍රයේ පිටපතක් අයදුම්පත්‍රය සමග ඉදිරිපත් කළ යුතුය.
4. පළාත් පාලන ආයතන වෙත වෙළද බලපත්‍ර ගාස්තු නොගෙවනු ලබන, සමාගම් පනත යටතේ සංස්ථා ගත කළ සමාගම් 2023 වර්ෂයට අදාලව පිරිවැටුම් බදු /ආදායම් බදු ගෙවන ලද බවට තහවුරු වන ලියවිලි ඉදිරිපත් කයුතුය

සැ.යු

සෑම අයදුම් පත්‍රයක් සමගම පහත ලියකිවිලි අමුණා තිබිය යුතුය.එසේ නොමැති සියළු අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරණු ලැබේ.

- ව්‍යාපාරය ලියාපදිංචි කිරීමේ සහතිකයේ පිටපත
- 2023 වර්ෂයට පළාත් පාලන ආයතන වෙත වාෂර්ික වෙළද බලපත්‍ර ගාස්තු ගෙවූ ලදුපතේ පිටපතක්

නාගරික කොමසාරිස්,
මහා නගර සභාව,
පොළොන්නරුව.